## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# ජාතිය ගොඩනැගීමේ බද්ද

## 2017.06.30 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා වාර්තා ඉදිරිපත් කිරීම සහ ගෙවීම් කිරීම්

2017.06.30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බද්දට අදාල වාර්තා ඉදිරිපත් කිරීම සහ අවසාන ගෙවීම් කිරීම සඳහා වූ අවසාන දිනය

## 2017 ජූලි 20

බව ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වන තැනැත්තන් වෙත මෙයින් සිහිපත් කරනු ලැබේ.

තවද,

(අ) යම් **භාණ්ඩයක් නිෂ්පාදනය** කිරීමේ ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන (ව්‍යතිරික්ත භාණ්ඩ හැර);

(ආ) බැංකු හෝ මූල්‍ය සේවා සැපයීම ද ඇතුළුව යම් **සේවා සැපයීමේ** ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන (ව්‍යතිරික්ත සේවා හැර); හෝ

(ඇ) **තොග සහ සිල්ලර වෙළඳාම්** ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන [විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද යටතේ ගැනෙන භාණ්ඩ එකී භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින්ම අලෙවි කරන්නේනම්, ඖෂධ, බලයලත් තැනැත්තන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් මැණික් හෝ ස්වර්ණාභරණ අලෙවි කිරීම, යම් මුද්‍රිත පොතක්, අපනයනය කරනු ලබන යම් භාණ්ඩයක්, අපනයනය කිරීම සඳහා යම් අපනයනකරුවකුට විකුණනු ලබන යම් භාණ්ඩයක්, යම් නිෂ්පාදකයෙකුගෙන් හෝ නිපදවන්නෙකුගෙන් මිල දී ගනු ලබන නැවුම් කිරි, පළාවර්ග, කුරුඳු හෝ රබර් (ඔට්ටපාලු, ක්‍රේප් රබර් හෝ රබර් ෂීට්) අලෙවි කිරීම, LP ගෑස් බෙදාහැරීම, තීරු බදු රහිත සාප්පුවල විදේශ ව්‍යවහාර මුදලින් භාණ්ඩ අලෙවි කිරීම, ඉන්ධන පිරවුම්හලක දී පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් විකිණීම, සිගරට්, සංයෝජිත වර්ගීකරන අංක(HS Code) 2203, 2204, 2205, 2206, 2207, 2208 හෝ 87 වන පරිච්ඡේදය යටතේ වර්ගීකරනය කර ඇති සහ සුරාබදු ආඥාපනත යටතේ හෝ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ බද්දට යටත් වාහන හෝ මත්පැන් ආනයනය හෝ නිෂ්පාදනය කරනු ලබන තැනැත්තා විසින්ම අලෙවි කරන්නේනම් හැර]

සෑම තැනැත්තෙකුම (තනි පුද්ගලයින්, සමාගම්, පුද්ගල මණ්ඩල) හෝ හවුල් ව්‍යාපාරයක්ම බද්දට යටත් වන පිරිවැටුමෙන් **2% ක්** ජාතිය ගොඩනැගීමේ බද්ද ලෙස ගෙවිය යුතු වේ.

**(ජා.ගො.බ. ට යටත් පිරිවැටුමේ සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3 ක් වේ.)**

**සටහන :**

- පහත සඳහන් දෑ ඉහත ඕනෑම කාණ්ඩයක් යටතේ බද්දට යටත් තැනැත්තන්ගේ හෝ හවුල් ව්‍යාපාරවල බද්දට යටත් පිරිවැටුමට **ඇතුලත් නොවිය** යුතුය.
  - එකතුකළ අගය මත බද්ද
  - **දරන ලද බොල් ණය** (කෙසේ වෙතත්, මීට පෙර කපා හරින ලද, අනතුරුව අය කර ගන්නා ලද බොල් ණය සැලකිල්ලට ගත යුතුය.)
  - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත යටතේ එම කාර්තුව තුල **ගෙවන ලද යම් නිෂ්පාදන බද්ද** (ආනයන අවස්ථාවේදී ගෙවන ලද නිෂ්පාදන බද්ද හැර)
  - අපනයන සංවර්ධන ප්‍රතිදාන යෝජනා ක්‍රමය යටතේ **ගෙවන ලද ප්‍රතිදාන**
  - **අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඕනෑම ජාත්‍යන්තර සිද්ධියකට** අදාලව සපයනු ලබන ඕනෑම භාණ්ඩ හෝ සේවාවන්ගෙන් ලැබෙන පිරිවැටුම
- **ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක්** (ව්‍යතිරික්ත භාණ්ඩ හැර) එකී ආනයන අවස්ථාවේදී එකතුකළ අගය මත බදු සඳහා වූ වටිනාකම මත **රේගුවේදී** ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වේ. එවැනි භාණ්ඩයක් කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියකට භාජනය නොකර විකුණනු ලබන්නේ නම් එවැනි භාණ්ඩ විකිණීම තොග සහ සිල්ලර වෙළඳාමක් ලෙස ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වේ.
- ඕනෑම බෙදාහරින්නෙක් (ආර්ථික සේවා ගාස්තු පනතෙහි දක්වා ඇති අර්ථානුකූලව) සම්බන්ධයෙන් තොග වෙළඳාමෙන් වූ බද්දට යටත් පිරිවැටුමෙන් 75% ක් සහ අනෙකුත් තොග සහ සිල්ලර වෙළඳාමෙන් වූ බද්දට යටත් පිරිවැටුමෙන් 50% ක් ප්‍රතිදනයක් ලෙස අඩුකළ හැකිය. **[මෙම ගැලපීමට පෙර බද්දට යටත් පිරිවැටුම කාර්තුවකට බදු නිදහස් සීමාව ඉක්මවන්නේ නම් බදු බැදියාවක් ඇති වේ].**
- **බැංකු හෝ මූල්‍ය ව්‍යාපාරයක්** කරගෙන යනු ලබන යම් තැනැත්තෙකුගේ බද්දට යටත් පිරිවැටුම, ආරෝපිත ක්‍රමය අනුව ගණන් බැලූ මූල්‍ය සේවා මත එකතු කළ අගයේ වටිනාකම සහ මූල්‍ය සේවා නොවන සේවාවන්ගෙන් පිරිවැටුම යන දෙකෙහි එකතුව විය යුතුය. (නිදහස් කිරීම්වලට යටත්ව)

**නියමිත දිනයන්ට හෝ ඉන් පෙර ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීම් නොකිරීම සම්බන්ධයෙන් වන දණ්ඩන මුදල් එසේ ගෙවීම් සිදු නොකිරීම යම් විශේෂිත හේතූන් නිසා සිදු වූවක් බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේනම්ද අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්තිසහගත වන්නේනම් ද මිසක අත්හැරීමක් හෝ අඩු කිරීමක් නොකරන බවට දන්වමි.**

**බැංකු හෝ මූල්‍ය ව්‍යාපාරයක් කරගෙන යනු ලබන තැනැත්තන් හැර, සියලුම තැනැත්තන් ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041556 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමේ බැරට ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැකිය. බැංකු හෝ මූල්‍ය ව්‍යාපාරයක් කරගෙන යනු ලබන තැනැත්තන් ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041560 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමේ බැරට ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැකිය.**

**කරුණාකර චෙක්පතේ පිටුපස බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) හා බදු කාල සීමාව සඳහන් කරන්න.**

**ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ගෙවීම් කිරීමේ දී ඔබ විසින් නව ගෙවීම් පත්‍රිකා භාවිතා කළයුතු අතර, එහි දී පහත සඳහන් ගෙවීම් කේතයන් ඊට අදාළ කාලසීමාවන් සඳහා නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන්න.**

| කාලසීමාව | | ගෙවිය යුතු දිනය | ගෙවීම් කේතය |
|---|---|---|---|
| 2017.06.01 | 30.06.2017 | 2017.07.20 | 17203 |

වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා **දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ 1944 අංකයට අමතන්න.**

**දේශීය ආදායම් වෙබ් ද්වාරය - www.ird.gov.lk**

**කරුණාකර කලට වේලාවට ගෙවීම් කරන්න.**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

**බදු - වඩා හොඳ අනාගතයකට**